We listen to you like a friend...
We advise you like a father...
Your negligence is our pain....

..Please

do not
Drink&
Drive..

This campaign
against irresponsible drinking
is sponsored by

FAIRFIELDS IMMIGRATION LAWYERS
Melbourne.

7 වන පිටුවෙන් (මහනුවර බලා ගිය)

රජයේ නිර්මාණයන්ය. දැන් එජාපයට ඒවා පාරා වළල්ලක් මෙන් කැරකෙයි.

රිය පෙරහරේදී නිට්ටඹුවේ සිදු වූ ඇබැද්දිය ගැන පරස්පර විරෝධී ප්‍රකාශ අසන්නට ලැබුණි. පෙළපාලි කරුවන් හොරොගොල්ල සමාධියට ඇතුළු වීමට දැරූ ප්‍රයත්නය ප්‍රදේශවාසීන් විසින් වළක්වනු ලැබූ බව කියනු ලැබේ. ඔවුන් සමාධි භූමියට ඇතුළුවීමට උත්සාහ කළේ තම 'රිය යාත්‍රාවට' ආශිර්වාදය ලබා ගැනීමට ද නැත්නම් පසුගිය දසක පහ තුළ බණ්ඩාරනායක නම ප්‍රසිද්ධියේ කෙලෙසීම ගැන සමාව අයැද සිටීමට දැයි අපි නොදනිමු.

සමහරුන් කියන්නේ සමාධි භූමියට ඇතුළු වීමට උත්සාහ කළේ එජාප පාක්ෂිකයන් නොව මංගල සමරවීර නායකත්වයෙන් යුත් ශ්‍රීලනිප (මංගල පාර්ශවයේ) පිරිස් බවය. ඔවුන්ට එසේ ඇතුළු වීමට ශ්‍රීලනිප සාමාජිකයන් වශයෙන් අයිතියක් තිබෙන බව සමහරු කියති. ඕනෑම කෙනෙකුට තමාගේ ප්‍රණාමය පුදු කළ හැකිය. එහෙත් මංගල සමරවීර මහතාගේ ශ්‍රීලනිපයට ඇති අයිතිය ගැන කියන විට පරම්පරා උරුමයෙන් නම් ඔහුට අයත් වන්නේ ශ්‍රීලනිප විරෝධී උරුමයකි.

අපි අවුරුදු 45කට පෙර සිදුවූ සිද්ධීන් දෙස ආපසු හැරී බලමු. මීයගිය අය ගැන විවේචන කිරීම මාධ්‍ය සදාචාරයට වතරම් උචිත නොවේ. එහෙත් මංගල සමරවීර මහතා බොහෝ අවස්ථාවල ප්‍රසිද්ධියේ ම තම පියාණන්ගෙන්ම ලැබුණු දේශපාලන දායාදය ගැන සඳහන් කළ නිසා ඒ අතීතය ඉතා ලුහුඬින් සිහිපත් කර දීම වැදගත්ය.

තරුණ නීතිඥයකු වූ මහානාම සමරවීර මහතා 1952 මහ මැතිවරණයට කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයෙකු ලෙස මාතර අසුනට ඉදිරිපත් කරන ලද්දේ දිවංගත දොස්තර ඇස්.ඒ. චිත්‍රමසිංහ මහතා විසිනි.

1955 දී ඔහු කොමියුනිස්ට් පක්ෂයෙන් ඉවත් වී භාෂා පෙරමුණෙන් 1956 මැතිවරණයට ඉදිරිපත් විය. මැතිවරණයෙන් පසු උප ඇමති පදවියක් ලත් ඔහු ශ්‍රීලනිපයට බැඳුණේය.

1959 බණ්ඩාරනායක ඝාතනයෙන් පසු විපක්ෂයේ සිටි සර්. ජෝන් කොතලාවල මහතාට අගමැති පදවිය බාර ගන්නා ලෙස ආරාධනා කිරීමට ගිය මන්ත්‍රීන් 7 දෙනාගේ කණ්ඩායමේ නායකයා වූයේ මහානාම සමරවීරය.

1960 මාර්තු මැතිවරණයේදී ඔහු ශ්‍රීලනිපයෙන් මාතර අසුනට තරඟ කළ නමුත් හිමි වූයේ පරාජයයි. ඔහු දෙවැනි තැනට පත් වූයේ කොමියුනිස්ට් අපේක්ෂක තුඩාවේ මහතාට වඩා ඉතා සුළු ඡන්ද සංඛ්‍යාවක් ලබා ගනිමිනි.

1960 ජූලි මැතිවරණයේදී ඔහුට පක්ෂ සමගිය උඩ මාතරට තරඟ කරන්නට අවස්ථාව ලැබුණේය. සමගි පෙරමුණු නිසා හේරී පත්වූ ඔහු සිරිමාවෝ බණ්ඩාරනායක රජයේ ඇමති පදවියක් ලැබුවේය.

එහෙත් 1964 දෙසැම්බර් මාසයේදී අති විශාල මුදල් ගනුදෙනු පිට සිදුවූ රජය පෙරළීමේ කුමන්ත්‍රණයේදී ඔහු ඉල්ලා අස්විය. ඉල්ලා අස් වූ බොහෝ දෙනා එජාපය සමඟ එක් වී 1965 මැතිවරණයේදී ජය ගැනීමට සමත් වුවද මහානාම සමරවීර අන්ත පරාජයක් ලැබීය. ඔහුගේ දේශපාලන දිවිය එතැනින් අවසන් විය.

පියාගේ අඩිපාරේ යමින් පුත්‍රයාද එම ක්‍රීඩාවේ ම යෙදෙන බව කවුරුන් හෝ කියනොත් එය වරදක්ද?

4 වන පිටුවෙන් (කෘතිරම)

ගැන සිතා විනිශ්චය කරන්නට ඇද්ද?

1984 මුද්‍රිත පිටපතේ පිට කවරයේ ඉහළින්ම එන වගන්තියක් ඇත . "විසිවන සියවසේ ලියවුණු හොඳම ප්‍රබන්ධ කතාව" යනුවෙනි.
තෑගි ලැබුණෝ ඒ හොඳම ප්‍රබන්ධ කතාවට ද යන අකාරුණික ප්‍රශ්නය අසන්නට සිදුවන්නේ එතැනදී ය.
කොහොමටත් අද තත්වය වෙනස් වී ඇද්දැයි නොදනිමි.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia